# දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියට (UNFCCC) ජාතික සන්නිවේදන වාර්තා සැකසීමේ කාර්යභාරය

**කේමා කස්තූරිආරච්චි**
**පරිසර කළමනාකරණ නිලධාරී, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය**
**පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය**

## පසුබිම

දේශගුණ විපර්යාස පසුගිය ශත වර්ෂය හමුවේ මනුෂ්‍ය වර්ගයා වෙත එල්ල වූ ප්‍රධාන තර්ජනයක් ලෙස සැලකේ. මේ නිසා 1992 දී පැවැති මිහිතල සමුළුවේදී වායු ගෝලීය හරිතාගාර වායු සාන්ද්‍රණය දේශගුණික පද්ධති කෙරෙහි හානිකර බලපෑම් නොකරන අන්දමින් පවත්වාගන යාමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) ඇති කරගන්නා ලදී. මෙම සම්මුතිය සඳහා පාර්ශ්වකරුවන් 195ක් ඇතුලත් වී ඇති අතර ශ්‍රී ලංකාව 1993 දී දේශගුණ විපර්යාස සම්මුතියේ පර්ශ්වකරුවෙක් විය. මෙම සම්මුතියේ බැදීම් වලට අනුව සියලුම පාර්ශ්වකරුවන් විසින් ජාතික සන්නිවේදන වාර්තා සකසා දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කලයුතුය. මෙහි මූලික අරමුණ වන්නේ දේශගුණ විපර්යාස පිළිබඳ රටක තත්වය ලෝක ප්‍රජාව හමුවේ ඉදිරිපත් කිරීමය. ඒ අනුව 2003 නොවැම්බර් මසදී පාර්ශවකරුවන්ගේ සමුළුවේදී පාර්ශ්වකරුවන් 106 දෙනෙකු ඔවුන්ගේ ප්‍රථම ජාතික සන්නිවේදන වාර්තාවන් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවද මෙම බැදීමට අනුකූලව ප්‍රථම ජාතික සන්නිවේදන වාර්තාව වර්ෂ 2000 දී ඉදිරිපත් කරනු ලැබීය. ඒ අනුව ගෝලීය පරිසර පහසුකම (Global Environment Facility) මඟින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හරහා ජාතික සන්නිවේදන වාර්තා සැකසීමේ ව්‍යාපෘති සඳහා මූල්‍ය ආධාර ලබා දුන් අතර දේශගුණ විපර්යාස පිළිබඳ සම්මුතියේ ජාතික කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස (National Focal Point) පරිසර අමාත්‍යාංශය මඟින් මෙය ක්‍රියාත්මක කරනු ලැබේ. 2012 වසර තුලදී ශ්‍රී ලංකාව විසින් එහි දෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකසා ඉදිරිපත් කරන ලදී.

## දේශගුණ විපර්යාස පිලිබඳ සන්නිවේදන වාර්තා සැකසීමේ ව්‍යාපෘතියේ ජාතික වැදගත්කම

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස හා බැඳුනු තත්ත්වයන් මූලික කරගනිමින් අංශික හා ජාතික සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තාක්ෂණික හා ආයතනික හැකියාව වර්ධනය කිරීම යෝජිත ව්‍යාපෘතියේ අරමුණු වේ. එය මූලික වශයෙන් දේශගුණ විපර්යාස පිලිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ වගකීම් ඉටුකිරීම සඳහා වූ දෙවන ජාතික සන්නිවේදන වර්තාව සකස් කර ඉදිරිපත් කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු විය. ඒ අනුව දේශගුණ විපර්යාස පිළිබඳ සන්නිවෙදන වාර්තා හුදෙක්ම තොරතුරු ඉදිරිපත් කිරීම පමණක් නොව එය රටේ සංවර්ධන ක්‍රියාදාමයට අදාලව දේශගුණ විපර්යාස ගැන අවධානය යොමුකරමින් තීන්දු තීරණ ගැනීමේදී මෙම වාර්තාව මෙවලමක් ලෙස උපයෝගී කරගත ශක.

## දේශගුණ විපර්යාස පිළිබඳ සන්නිවේදන වාර්තා සැකසීමේ ක්‍රියාදාමය

මෙම සන්නිවේදන වාර්තාවන් සැකසීම සඳහා දේශගුණ විපර්යාස සම්මුතියේ සිටින විද්වතුන් මගින් විධිමත් ලෙස සකසන ලද රටවල් සඳහා වූ උපදෙස් මාලාවක් අට වන පාර්ශවකරුවන්ගේ සමුළුවේදී සම්මත වූ අතර මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වෙද්දී එම උපදෙස් මාලාවන් පිළිපැදිය යුතුය. ඊට අමතරව මෙම වර්තාවට ඇතුලත් විය යුතු විෂය පථයන්ට අදාල තොරතුරු ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳ සැකසුනු උපදෙස් මාලාවන් සහිත අත්පොත් සකසා ඇත. තවද මෙම වාර්තාවේ ප්‍රධාන අංගයන්

විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීම සඳහා උපයෝගී කරගත හැකි ක්‍රමෝපායන් විද්වත් මණ්ඩලයක් මගින් සකසා ඇත. එම විශේෂිත වූ උපදෙස් මාලාවන්, තොරතුරු, දත්ත උපයෝගී කරගනිමින් රටේ සිටින දේශගුණ විපර්යාස හා සම්බන්ධ විද්වතුන්ගේ දායකත්වයෙන් සන්නිවේදන වාර්තාව සැකසීමේ කර්තව්‍ය සිදු කෙරේ.

## දේශගුණ විපර්යාස පිළිබඳ සන්නිවේදන වාර්තාවක තිබිය යුතු සංරචක

1. ජාතික තත්ත්ව වාර්තාව සඳහා තොරතුරු සම්පාදනය
2. හරිතගාර වායු ඉන්වෙන්ට්‍රිය
3. දේශගුණ විපර්යාස පිළිබඳ අවදානම හා ඊට අනුවර්තනය වීම
4. දේශගුණ විපර්යාස බලපෑම් සමනය කිරීම
5. දේශගුණ විපර්යාස පිලිබඳ දැනුම් වර්ධන වැඩසටහන්

- දේශගුණ විපර්යාස පිලිබඳ නියමනුකුල නිරීක්ෂණ හා තාක්ෂණික හුවමාරු පිළිබඳ පර්යේෂණයන්
- දේශගුණ විපර්යාස පිලිබඳ අධ්‍යාපන, පුහුණු හා ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන්

## දේශගුණ විපර්යාස පිලිබඳ දෙවන සන්නිවේදන වාර්තාව සැකසීම තුලින් අප ලැබුදේ

### 1. ජාතික තත්ත්ව හා තොරතුරු

ශ්‍රී ලංකාවේ භෞතික හා සමාජ ආර්ථික ගුණාංග පිළිබඳව වූ ජාතික තත්ත්ව තොරතුරු හා එම තොරතුරු දිවයිනේ දේශගුණ විපර්යාස හා තිරසාර සංවර්ධන ගැටළු කෙරෙහි බලපාන අන්දම මෙහිදී අධ්‍යයනය කරනු ලැබීය.දෙවන ජාතික සන්නිවේදන වාර්තාව සැකසීම දේශගුණ විපර්යාස හා සංවර්ධනය අතර ඇති බැඳීම අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය සවිමත් කර ගැනීමේ ක්‍රියාවලිය සවිමත් කර ඇත. මෙහිදී ශ්‍රී ලංකාව වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති හා සැලසුම් දේශගුණ විපර්යාස කරුණු කෙරෙහි අදාල වන ආකාරය විමර්ශනය කෙරිණි

### 2. හරිතාගාර වායු ඉන්වෙන්ට්‍රිය

ජාතික සන්නිවේදනයේ ප්‍රධාන අංගයක් ලෙස ජාතික හරිතාගාර වායු ඉන්වෙන්ට්‍රිය සැලකිය හැක. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) දැක්වෙන මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන විමෝචන පිළිබඳ මූලාශ්‍ර දැක්වෙන ඉන්වෙන්ට්‍රියක් සකස්කිරීම කලින් කල යාවත්කාලීන කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සහ ක්‍රියාත්මක ක්‍රමවේදයන් අනුගමනය කරමින් සියලූ හරිතාගාර වායු බැහැර කිරීම පිණිස සියලූ පාර්ශවයන් කටයුතු කල යුතුව ඇත. වැඩිදුරටත් මොන්ට්‍රියල් සන්ධානයෙන් අනුදත් ප්‍රමාණයට පාලනය නොකළ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විමෝචනය වන සියලූ හරිතාගාර වායු පිලිබඳ ඉන්වෙන්ට්‍රිය සෑම පාර්ශව රටක් විසින්ම පිළියෙළ කර පාර්ශ්ව සම්මේලනය වෙත ඉදිරිපත් කල යුතුය.

ශ්‍රී ලංකාව විසින් 1994 දී හරිතාගාර වායු විමෝචන දත්ත උපයෝගී කරගනිමින් විශ්ලේෂණය කොට හරිතාගාර ඉන්වෙන්ට්‍රිය සකසා ප්‍රථම ජාතික සන්නිවේදන වාර්තාව තුලින් ඉදිරිපත් කර ඇති අතර 2000 වසර සඳහා හරිතාගාර වායු ඉන්වෙන්ට්‍රිය ඇස්තමේන්තු ගත කර දෙවන ජාතික සන්නිවේදන වාර්තාව මගින් ඉදිරිපත් කරන ලදී. මෙහිදී දේශ ගුණ විපර්යාස පිලිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩල (IPCC) විද්වතුන් මගින් සකසන ලද මාර්ගෝපදේශයන් පදනම් කර ගනිමින් ඉන්වෙන්ට්‍රියන් සකසන ලදී.

### 3. දේශගුණ විපර්යාස අවදානම හා ඊට අනුහුරු වීමේ වැඩසටහන්

අවදානම හා ඊට අනුහුරු වීම පිලිබඳ ඇගයීමේ විෂය පථය ඉතා පුළුල් හා ඊට ආර්ථිකයේ තීරණාත්මක අංශ මෙන්ම දේශගුණ විපර්යාසයන් හමුවේ ආපදාවට ලක් වන ආකාරය පිළිබඳ තොරතුරු දත්ත ඇතුලත් කොට ඇත. ආපදාවට අනුහුරු වීමේ හැකියාව පුද්ගල ධරිතාවය මත තීරණය වන අතර එහි සමාජ ආර්ථික විශ්ලේෂණයක් මෙහිදී සිදු කරන ලදී.

ජාතික මට්ටමේදී කෘෂිකර්මාන්තය, බලශක්ති හා ජලය ආදී අංශ නියගය හේතුවෙන්ද, වාහකයන් මඟින් බෝවන රෝග පැතිරීම, අහිතකර දේශගුණයන් නිසා ඇතිවන ස්වභාවික ව්‍යසන ආදියට මුහුණ දීමට ගතහැකි ක්‍රියාමාර්ග මෙහිදී හඳුන්වා දී ඇත.

## 4. අධ්‍යයන, පුහුණුව හා මහජන දැනුවත් කිරීම හා තොරතුරු ජාලකරණය

දේශගුණ විද්‍යාව, කාලගුණ විද්‍යාවේ මූලික සංකල්ප, පරිසරය, ජෛව විවිධත්වය හා දේශගුණ විපර්යාස ඇතුලත් කර පාසල් විෂය මාලාව වෙනස් කොට ඇත. විශ්ව විද්‍යාල මට්ටමමේ විෂය මාලාවට පවා දේශගුණ විපර්යාස විෂය මාලාව ඇතුලත් කොට ඇත.

## ඉදිරි පියමග

මේවන විට ශ්‍රී ලංකාවේ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සැකසීම සඳහා මූලික පියවර ගෙන ඇති අතර පසුගිය ක්‍රියාදාමයන්ගේ අඩුලුහුඩුකම් අධ්‍යයන කොට එම අඩුලුහුඩුකම් මහරවා ගැනීමට නිසි පියවර හඳුනාගනිමින් තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සැකසීමේ ක්‍රියාදාමය මේ වසර තුලදී ආරම්භ කිරීමට නියමිතයි